museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2023 පෙබරවාරි

## ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයේ නැගී එන තරුණ වෘත්තිකයින්

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) යනු සාමාන්‍ය ජනතාව, පාසල්, මෙන් ම සංචාරකයන්ගේ ද ප්‍රයෝජනය හා රසවින්දනය සඳහා නූතන සහ සමකාලීන කලා කෘති ප්‍රදර්ශනය, පර්යේෂණය, රැස්කිරීම, සහ සංරක්ෂණය වෙනුවෙන් කැප වූ පොදු කෞතුකාගාරයක් පිහිටුවීම අරමුණු කරගත් අධ්‍යාපනය පෙරටුකරගත් මුලපිරීමකි. ලොව පුරා බොහෝ කෞතුකාගාර සිය මානව සම්පත් කෙමෙන් අඩුකරන කාලයක, ක්‍රියාශීලී තරුණ වෘත්තිකයන් කණ්ඩායමක් මෙම ඉතා වැදගත් මුලපිරීම ඉදිරියට ගෙනයමින් සිටියි. 2019 දියත්කරන විට හතර දෙනෙකුගෙන් සැදුම්ලත් MMCA ශ්‍රී ලංකා කණ්ඩායම, 12 දෙනෙකුගෙන් යුත් පූර්ණ කාලීන කණ්ඩායමක් දක්වා වර්ධනයවී ඇත. මෙම ගොඩනැගෙන වෘත්තිකයින් කණ්ඩායමට අධ්‍යාපන හා මහජන වැඩසටහන් සහාය අභිරක්ෂක ප්‍රමෝදා වීරසේකර, ඉගෙනුම් සහ පුහුණු අභිරක්ෂක සානුජ ගුණතිලක, සහ පර්යේෂණ සහායක තිනාල් සජීව ඇතුළත් ය. මෙම නැගී එන තරුණ වෘත්තිකයෝ MMCA ශ්‍රී ලංකාහි ඔවුන්ගේ ගමන පිළිබඳ අදහස් බෙදාගත්හ.

### 1. MMCA ශ්‍රී ලංකාහි ඔබ ගෙවා ඇති කාලය තුළ කැපීපෙනෙන අවස්ථා මොනවා ද?

### ප්‍රමෝදා:

2019 වර්ෂයේ MMCA ශ්‍රී ලංකාහි ආරම්භක කණ්ඩායමේ කෙනෙකු ලෙස සම්බන්ධවූ දා පටන්, මට විශේෂතම අත්දැකීමවුණේ 'පුංචි කතා සියක් දහසක්' නම්වූ අපගේ පළමු ප්‍රදර්ශනයයි. අපි සංවිධානයකළ සියලු ම පොදු වැඩසටහන් සහ පාසල්/විශ්වවිද්‍යාල චාරිකා පිටුපස ඇති අභිරක්ෂක ක්‍රියාවලියට සහයවීම මට විශාල තෘප්තියක්වුණා. 2020 වර්ෂයේ ආදරවන්තයින්ගේ දිනයේදී පෙර පාසල් දරුවන් 60 දෙනෙකු සඳහා අපි සංවිධානයකළ විශේෂ ක්ෂේත්‍ර චාරිකාව මට අමතක නොවන පාසැල් චාරිකාවක්.

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

**සානුජ:**

අපගේ බාහිර අධ්‍යාපනඥයින්ට නරඹන්නන්ගෙන් ලැබෙන ධනාත්මක ප්‍රතිචාර දැකීම, හා සීමාවාසිකයකු මෙම ක්ෂේත්‍රයේ දිගු කාලීන වෘත්තීයකට දක්වන ඇල්ම පිළිබඳ ඇසීම මට හැමවිට ම සුවිශේෂ අවස්ථා වෙනවා. වසරක මාර්ගගත පර්යේෂණ සහ සැලසුම්කරණයකින් පසුව පසුගිය වසරේ පැවැත්වූ අපගේ පළමු ජාත්‍යන්තර සහයෝගී වැඩසටහනවන 'කෞතුකාගාර තීව්‍රය' ද මට කැපී පෙනෙන අවස්ථාවක්වුණා.

**තිනාල්:**

එක් විශේෂ අත්දැකීමක්වූයේ මගේ පූර්ණ කාලීන තනතුරට පෙර මා කෞතුකාගාරයේ ලැබූ සීමාවාසික පුහුණුවයි. මෙහි යහපත් හා සහයෝගිමත් සේවා පරිසරයට මෙන් ම, මගේ පළමු පෙළ කළමනාකරුවන්ගෙන් ලැබුණු මගපෙන්වීම සහ උපදේශනයට මම කෘතඥ වෙනවා. MMCA ශ්‍රී ලංකා හා සම්බන්ධවූ දා සිට මෙම සාධක මගේ පෞද්ගලික සහ වෘත්තීය වර්ධනයට ඉමහත් ලෙස දායකවෙලා තිබෙනවා.

## 2. කණ්ඩායමට සම්බන්ධවූ දා සිට ඔබේ වගකීම් වර්ධනයවී ඇත්තේ කෙසේ ද?

**ප්‍රමෝදා:**

මගේ පළමු වසරේ ප්‍රධාන වශයෙන් සිදුකළේ ශ්‍රී ලංකාව හා කොළඹ අවට අධ්‍යාපනික භූ දර්ශනය පිළිබඳ පර්යේෂණ කිරීම සහ, කෞතුකාගාරයේ ව්‍යාප්ති වැඩසටහන සංවිධානය කිරීමයි. අපගේ දෙවන ප්‍රදර්ශනයවන 'මුණගැසීම්' ආරම්භවූ පසු පොදු වැඩසටහන් සඳහා අප ගත් ප්‍රවේශය වර්ධනයවී ඒ සමඟ මගේ කාර්යභාරය ද වර්ධනයවුණා. සියලු ම ඉලක්කගත ප්‍රේක්ෂක කණ්ඩායම් සඳහා පොදු වැඩසටහන් සංවිධානයකර ක්‍රියාත්මකකිරීමට මම සැලකියයුතු සම්පත් දායකයින් සංඛ්‍යාවක් සමඟ වැඩකිරීමට පටන්ගත්තා.

**සානුජ:**

මම 2021 මැද භාගයේදී MMCA ශ්‍රී ලංකා වෙත අයදුම්කර එහි ඉගෙනුම් සහ පුහුණු සහය අභිරක්ෂක ලෙස සම්බන්ධවුණා. 2022 මුල මා ඉගෙනුම් සහ පුහුණු අභිරක්ෂක ලෙස උසස්කෙරුණා. මගේ කාර්යභාරයට, අපගේ සියලු ම පුහුණු ක්‍රියාකාරකම් පිළිබඳ පර්යේෂණකිරීම, ඒවා කළමනාකරණයකිරීම, සහ ඒවා ඇගයීම ඇතුළත්වෙනවා. ඊට අමතරව, මම අලුත්, දිගු කාලීන වැඩසටහන් සංකල්පනයකිරීමට පටන්ගෙන තියෙනවා.

**තිනාල්:**

MMCA ශ්‍රී ලංකාවට බාහිර අධ්‍යාපනඥයෙකු ලෙස සම්බන්ධවූ පසු, මගේ මූලික වගකීම් අතරට අමුත්තන් සමඟ ගනුදෙනුකිරීම සහ පොදු වැඩසටහන්වලට සහායවීම ඇතුළත්වුණා. මගේ සීමාවාසික පුහුණුව තුළ, ප්‍රදර්ශන නිෂ්පාදන ක්‍රියාවලියේදී, කලාකෘති සමඟ තවදුරටත් සම්බන්ධවීමට මට අවස්ථාව ලැබුණා. මගේ වර්තමාන පූර්ණ කාලීන තනතුර තුළ මම පර්යේෂණ පැවැත්වීම සහ එකතුවක් ලැයිස්තුගතකිරීම පිළිබඳව වගකියන අතර, එය කෞතුකාගාරයේ මගේ වගකීම්වල වර්ධනය සහ වැඩිවෙන බැරෑරුම්කම පිළිබිඹුකරනවා යැයි මම හිතනවා.

**3. ඔබ MMCA ශ්‍රී ලංකාහි සේවය කිරීමට කැමති ඇයි?**

**ප්‍රමෝදා:**

කලාව හා සම්බන්ධ මගේ සාරධර්ම කෞතුකාගාරයේ ප්‍රවේශයත් සමඟ ඉතා සමීපව ගැලපෙනවා. ශ්‍රී ලංකාවේ නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයක් පිහිටුවීම වෙනුවෙන් කෞතුකාගාරයේ ක්‍රියාන්විතය ද, මෙම අභියෝගයට මුහුණදීමට මූලික කණ්ඩායම සහ එහි ආරම්භක සාමාජිකයින්ගේ වෙහෙස ද මම සැමවිට විශ්වාසකළා. දැනුම හුවමාරුකර ගැනීම සහ ඉගෙනුම් අත්දැකීම් හරහා සිසුන්, කලා අධ්‍යාපනඥයින්, ළමුන්, බුද්ධිමතුන්, සහ කලාකරුවන් යන ප්‍රජාවලට ආපසු යමක් ලබාදීමට මා තුළ ඇති ආශාව මාව ශක්තිමත්කරනවා.

**සානුජ:**

කෞතුකාගාර පදනම්කරගත් ඉගෙනුම් සහ නිර්මාණාත්මක අවකාශ ගොඩනැගීම කියන්නේ, දිනෙන් දින දියුණුවන ඩිජිටල්-උමතු ලෝකයකට යටත් නොකළහැකි, අප අවට භෞතිකව දකින්න ඇති සංසිද්ධි. එය මම ඉතා ප්‍රියකරන දෙයක්. ඉගෙනුම් සහ පුහුණු පිළිබඳ මගේ වර්තමාන භූමිකාව බොහෝ විට අනාගතය දෙස බලනවා. ඒ නිසා, මතු කලෙක සංස්කෘතික හා ආර්ථිකමය වශයෙන් සංකේතාත්මක සංවිධානයක්වීමට MMCA ශ්‍රී ලංකා යන ගමනට දායකවීම මට බෙහෙවින් වටිනවා.

**තිනාල්:**

මම මුලින් කලාවට උනන්දුවක් දැක්වූයේ නැති නමුත්, කෞතුකාගාරයේ වැඩකිරීමට අවස්ථාවක් ලැබීමෙන් පසු මෙම ක්ෂේත්‍රය තුළ පුද්ගලික වර්ධනයට ඇති අවස්ථා මම වටහාගත්තා. ඒ නිසා මම මගේ කුසලතා වර්ධනයකර ගැනීමටත්, යම් දිනෙක කෞතුකාගාරයේ අභිරක්ෂක කෙනෙකු වීමටත් උනන්දුවෙන් ඉන්නවා.